කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
**University of Kelaniya - Sri Lanka**

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
***Centre for Distance and Continuing Education***

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි පළමු පරීක්ෂණය (බාහිර) - 2019
**Bachelor of Arts (General) Degree First Examination (External) - 2019**

2023 අප්‍රේල් / මැයි
**April / May 2023**

මානවශාස්ත්‍ර පීඨය
**Faculty of Humanities**

භාෂා පරිවර්තන ක්‍රම
**Translation Methods**

**TRMD E 1015**
සිංහල/දෙමළ හා ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව / **Language Competence in Sinhala/Tamil and English**

පළමු කොටසින් පළමුවන ප්‍රශ්නය සහ අවම වශයෙන් තවත් එක් ප්‍රශ්නයක් ද, දෙවන කොටසින් අවම වශයෙන් කැමති ප්‍රශ්න දෙකක් ද ඇතුළත් වන සේ ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 — කාලය : පැය 03.00 යි.
**No. of Questions : 08** — **Time : 03.00 Hours**

---

I කොටස / **Part I**

01. පහත සඳහන් මාතෘකා අතුරින් එකක් තෝරා ගෙන වචන 350-400 පමණ වන සේ රචනයක් ලියන්න.

(ලකුණු 20)

i. සාහිත්‍ය පරිවර්තනය සහ සංස්කෘතිය
ii. විශ්වවිද්‍යාල ශිෂ්‍යයාගේ කාර්යයභාරය
iii. භාෂා ඉගෙනීමේ වැදගත්කම
iv. භාෂාව හා සමාජය

*(ඇ. පි. බ/ P. T. O)*

02. පහත සඳහන් ඡේද කියවා එහි ඇති වචන ප්‍රමාණයෙන් තුනෙන් එකක් වන සේ සාරාංශ කොට ලියා, ඊට සුදුසු මාතෘකාවක් ද යොදන්න. ඔබ විසින් යොදන ලද වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

(ලකුණු 20)

මනමේ නාටකයට පසුබිම් වී ඇත්තේ පන්සිය පනස් ජාතක පොතෙහි ඇතුළත් වන තුන්සිය හැට අට වන ජාතක කථා වස්තුව වන චුල්ලධනුර්ධර ජාතකයයි.[1] ස්ත්‍රීන් කෙරෙහි ආසක්ත වීමෙහි ආදීනව දැක්වීම සඳහා දේශිත මේ ජාතක කථා වස්තුව හුදෙක් එම තේමාව මතු නො ව විදග්ධ පාඨකයාගේ විමර්ශනාක්ෂිය පුබුදු කරවීමෙහි ලා පොහොසත් වූ භාව පූර්ණ අත්දැකීමක් ළං කරන්නක් සේ ද හැඳින්විය හැකි ය. මිනිස් සිත ගැඹුරින් විග්‍රහ කිරීමෙහි ලා ජාතක කථා කතුවරයින් විසින් දක්වනු ලැබ ඇති ප්‍රතිභාව ඉමහති. ඔවුහු විටෙක සදය උපහාසයෙන් යුතු ව මිනිස් දුබලකම් කෙරෙහි තම අවධානය යොමු කළහ; තවත් විටෙක මිනිස් ස්වභාවය කෙරෙහි තම අනුකම්පාව පළ කළහ; තවත් විටෙක මධ්‍යස්ථතාව භජනය කළහ; තවත් විටෙක මිනිස් සිත ගැඹුරින් විමර්ශනය කළහ; චුල්ලධනුර්ධර ජාතකයෙහි දී මිනිස් සිත ක්‍රියාත්මක වන ආකාරය කෙරෙහි විදග්ධ පාඨකයාගේ විමර්ශනාක්ෂිය යොමු කරවමින් එය රචනා වී ඇති ආකාරය දැක ගත හැකි ය. එය මිනිස් සිත ගැඹුරින් විග්‍රහ කෙරෙන විශිෂ්ට කලා කෘතියකි. මනමේ නාටකය ඇගයීමෙහි නියුතු බොහෝ ලේඛකයින් චුල්ලධනුර්ධර ජාතක කථාව කෙරෙහි දක්වන්නේ ඍණාත්මක ආකල්පයකි. සම්භාව්‍ය සිංහල සාහිත්‍ය අවතක්සේරුවට භාජනය කිරීමේ අපේක්ෂාවෙන් ඇතැම්හු ජාතක පොතෙහි ඇත්තේ බමුණු මත හෝ බමුණු ආකල්ප යැයි මුසා බස් දොඩවති.

පන්සිය පනස් ජාතක පොතෙහි බොහෝ කථාවස්තු මගින් බමුණු සමාජය විසින් අගය කරන ලද නොයෙක් ඇවතුම් පැවතුම් විවේචනයට භාජනය කර ඇත. මේ ජාතක කථාවෙන් ද එකල දඹදිව තක්සලා නුවර දිසාපාමොක් ගුරු කුලයෙහි පැවති කුල සිරිතක් විචාරයට හසු කර ඇත. එය පසුබිම් කොටගෙන කාලීන සමාජ ධර්මයන් කෙරෙන් පීඩනයට පත් ස්ත්‍රී වර්ගයාගේ ඛේදවාචකය මේ කථා වස්තුවෙන් නිරූපණය කෙරෙයි. හොඳ ම ශිෂ්‍යයාට හොඳ ම ස්වාමිපුරුෂයෙකු විය නොහැකි බව මෙම ජාතක කථාවෙන් මතු නො ව උම්මග්ග ජාතකයෙන් ද අවධාරණය කර ඇත.[2] උම්මග්ග ජාතකයෙහි සිරිකාලකන්නි ප්‍රශ්නයෙහි දිසාපාමොක් ආචාරීන් විසින් පිංගුත්තර නම් වූ මානවකයාට තම දියණිය පාවා දෙනු ලබන්නේ ඔහු තමන්ට ප්‍රිය වූ දක්ෂතම සිසුවා බැවිනි.

1 **පන්සිය පනස් ජාතක පොත් වහන්සේ**, දෙවන කාණ්ඩය, (1995) බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල 961-964 පිටු

2 **උම්මග්ග ජාතකය, සිරි කාලකන්නි ප්‍රශ්නය**

03. පහත සඳහන් වාක්‍යයන්හි ලේඛන සිංහල රීතියට අනුගත නොවන තැන් ඇතොත් ඒවා නිවැරදි කොට නැවත ලියන්න.

(ලකුණු 2 × 10 = 20)

i. දක්ෂ ගුරුවරයකු වූ ඔහු ගායකයකු ද විය.
ii. මෙවර ශ්‍රී ලාංකිකයෝ තරගයෙන් ජය ගනීවි.
iii. නිළියක් සහය නිළියක සමඟ වේදිකාවට පැමිණියහ.
iv. ගංගා තුමු නිහඬව ගලා බසී.
v. ළමයෙක් පාසලට එද්දී ගවයෙක් තණ කමින් සිටියේය.
vi. සියලු නෑදෑ හිතවතුන් මේ නිවේදනය පිළිගනිත්වා.
vii. කම්කරුවෝ පාලම ඉදි කරද්දී ඉංජිනේරුවන් සුපරික්ෂාකාරීව බලා සිටිති.
viii. වෛද්‍යවරියක් විසින් රෝගියා සුවපත් කරනු ලැබිණි.
ix. ඇමරිකානුවෝ විසින් අඟහරු මතට යානාවක් යවනු ලැබේ.
x. තරුණ නිවේදිකාවක් විසින් පුවත් කියවනු ලැබිණි.

04. පහත සඳහන් ප්‍රශ්න සඳහා නිවැරදි වාක්‍යය නිර්මාණය කිරීමට සුදුසු වචන වරහන් තුළින් තෝරා පිළිතුරු පත්‍රයෙහි සඳහන් කරන්න.

(ලකුණු 2 × 10 = 20)

i. විවෘත අදහස් ඇති (අයෙක් / අයෙකු) සමඟ කරනු ලබන සාකච්ඡාවක දී බොහෝ ප්‍රතිඵල ලද හැකි යැයි (විද්වත්හු / විද්වතුන්) අදහති.

ii. සියලුම (අරගලකරුවන් / අරගලකරුවෝ) දින කිහිපයකින් විසිර යතියි ජනාධිපතිවරයා කල්පනා කළ බව පොලිස් මධ්‍ය ප්‍රකාශකවරයා (ප්‍රකාශ කළේය / ප්‍රකාශ කළහ).

iii. සිය කටයුතු මැනවින් සිදුකරන ජීවිතය ජයග්‍රහණය කරන (මිනිස්සු / මිනිසුන්) ලොව ඕනෑ තරම් ජීවත් වන බව විදුහල්පතිවරයා (සිසුහු / සිසුන්) සමඟ ප්‍රකාශ කළේය.

iv. කෙතරම් අසාධාරණයට ( ලක්වූවෙක් / ලක්වූවෙකු) වුව ද රටක පවතින නීතිවලට අනුගත විය යුතු බැවින් සියලු (උද්ඝෝෂකයෝ / උද්ඝෝෂකයන්) වැරදිකරුවන් වන බව විනිසුරුතුමා තීරණය කළේය.

v. (ගුරුවරුන් / ගුරුවරු) මහත් වූ කැපවීමෙන් යුක්තව සිය ශිෂ්‍යයන්ට ශිල්ප ලබා දෙනු වස් දිවා රෑ නොබලා (වෙහෙසෙයි / වෙහෙසෙති).

vi. බොහෝ විදේශීය පඬිවරුන් සමඟ කටයුතු කළ (එතුමා / එතුමන්) ශ්‍රී ලංකාවේ ප්‍රකට විද්වතුන් අතරෙහි අග්‍රගණ්‍ය (පඬිවරයෙකු / පඬිවරයෙක්) වෙයි.

vii. ස්වකීය (දරුවන් / දරුවෝ) නොමග යනු දැක බොහෝ (දෙමාපියන් / දෙමාපියෝ) විස්සෝප වෙති.

viii. ඔහුගේ බාල (සහෝදරයන් / සහෝදරයෝ) ද මාගේ දෙමාපියෝ ද විදුහල්පතිවරයා පාසල හැරගිය පුවත අසා බොහෝ දුකට පත් (වූහ / විය).

ix. (ඔවුන් / ඔවුහු) ස්වකීය වෘත්තීය මැනවින් කරන්නාහු සිය අඹුවන් සමඟ සතුටින් කාලය ද ගත (කරන්නේ ය / කරන්නාහු ය).

x. වෛද්‍යවරයා සිය සේවකයන් ලවා රෝහලෙහි (රෝගීහු / රෝගීන්) පිරිසුදු (කරවති / කරවයි).

## II කොටස / Part II

**05. Read the passage and answer the following questions.**

On the night of April 14, 1912, the R.M.S. Titanic chugged through the frigid waters of the North Atlantic Ocean, its over 2,200 riders unaware of the looming danger.

Less than a week earlier, the luxury steamship—at the time the largest man-made moving object in the world—left Southampton, England, for New York City. Travelers had expected a posh and comfortable ride. After all, the Titanic's lavishly decorated first-class section featured gourmet meals, a heated pool, and squash courts. The ship even had its own onboard newspaper.

But the Titanic's design also had major flaws. For instance, some believe that many of the bolts that held the ship together were weak. The bottom of the boat was also not built to withstand major flooding. And the steamship carried just 20 lifeboats—only enough to hold about half of the passengers.

Four days after setting sail, the Titanic struck an iceberg that tore a 300-foot gash into the ship's hull. As it flooded, riders began a frenzied evacuation into the lifeboats. Only about 700 would survive. And the ship, which took three years to build, would sink in less than three hours. Though scientists and historians believe that the design flaws were the major factors that led to the disaster, they continue to study the famous steamship for answers. So more than a hundred years after the Titanic tragedy, its story remains afloat.

Source - https://kids.nationalgeographic.com/history/article/a-titanic-anniversary

I. **State whether the following statements are True of False.** (2*5 =10 marks)

i. The Titanic carried 2200 passengers.
ii. In 1912, the Titanic was the second largest man-made moving object in the world.
iii. The Titanic was scheduled to reach Southampton, England at the end of its journey.
iv. The Titanic was a diesel-powered ship.
v. The Titanic took more than five years to be built.

II. **Answer the following questions.** (2*5 = 10 marks)

i. What were the facilities provided for the first-class section of the Titanic?
ii. List out the three major flaws of the Titanics design.
iii. How many passengers survived the accident?
iv. What do the scientists and historians believe?
v. Suggest a suitable title for this passage

**06. Develop a paragraph on the following topic sentence adhering to the basic paragraph writing rules (minimum 100 words).**

Reading helps English language learning students to improve vocabulary.

(20 marks)

**07. Paraphrase the following paragraphs**

(20 marks)

In 1800, the population reached 1,000,000,000. Yet in the past two centuries, it has skyrocketed to today's 6,000,000,000. There are three reasons why such unprecedented population growth has occurred. The first is the ability of the human species to adapt to new habitats. Early humans possessed the ability to learn and to remember, as well as the ability of being able to communicate what they knew to others. Humans have been able to use their technologies not only to disperse themselves virtually all over the globe, but to make their environment perfectly suitable for them if it is not naturally so. While most animals are "designed" to fit a certain habitat, humans have almost always made wherever they chose to live their habitat.

Humans have also been able to bypass what might have been natural limits on Earth's "carrying capacity." Carrying capacity is the maximum population that a habitat can support over a long period of time. However, humans have been able to increase that natural capacity by improvements in agriculture, as well as human use and management of natural resources.

The third and probably most significant reason why our population has exploded in the past 200 years is that many of the natural or built-in limits on growth were eventually limited themselves or even done away with. While death is still inevitable for every human born, the death rate has gone down dramatically. This means that more people are living longer than they used to.

Source-*https://www.encyclopedia.com/social-sciences/applied-and-social-sciences-magazines/population-growth-and-control-human*

**08. Rewrite the following sentences adhering to formal writing rules.**

(2*10= 10 Marks)

i. They are letting us stay 5 days in the hotel.
ii. I've used so many examples in my answer.
iii. Lecturers still count on students to use correct grammar in essays.
iv. I really enjoy playing cricket because it provides relaxation and is superb for both my physical and mental health.
v. Kids love bursting crackers and different fireworks like sparklers, rockets, flowerpots etc.
vi. Nowadays, people buy LCD or LED TV sets for clear pictures.
vii. He was gonna talk to the teacher regarding the upcoming holidays.
viii. But TRMD students didn't like to change the lecture schedule.
ix. It was just a piece of cake for her to finish the assignment on time.
x. It wasn't easy for the students to switch to online learning.